# අලුත් අවුරුද්දේ අලුත් ආකල්ප සහිත ප්‍රවේශයක්

අතීතයේ ශ්‍රී ලංකාව හඳුනාගෙන සිටියේ ඉන්දියන් සාගරයේ මුතු ඇටය යන විරුදාවලියෙනි. පෙරදිග ධාන්‍යාගාරය නොඑසේනම් දහම්ද්වීපය යන කීර්ති නාමයෙන් ද හඳුන්වනු ලැබ සිටියේය. පෙරදිග ධාන්‍යාගාරය ලෙස ද සඳහන් වූයේ බත බුලතින් සරු සාර ව පැවති හෙයිනි. දේශගුණය, පිරිසිදු වාතය, අසීමිත ජල පහසුව හා මහජනතාවගේ ආගන්තුක සත්කාරය සම්බන්ධයෙන් අපරට ලෝක පූජිතය.

වර්තමානයේ පවතින තොරතුරු සන්නිවේදන ජයග්‍රහණ අනුව ලෝකය සමීප වී තිබේ. ශ්‍රී ලංකාව තව දුරටත් හුදෙකලා දූපතක් නොවේ. ලෝකයේ ඕනෑම තැනක සිදුවන යමක්, වෙනස්කමක් සැනෙකින් දැනෙන අසන්නට හෝ දකින්නට හැකි වටපිටාවක් අපට ඇත. මෙවන් යුගයක බාහිර බලපෑම් නතරකිරීම පහසු නැත. සන්නිවේදනය නිසා රටින් රට පවතින සබඳතා වහා මිශ්‍ර වෙයි. සමාජයට දැනෙන තත්ත්වයක් උදා වෙයි. මේ හෙයින් ලෝක ස්වභාවය අපට ආගනුතුක නැත.
මාධ්‍ය හා තාක්ෂණය සම්බන්ධයෙන් වේගවත් වර්ධනයක් සිදුවන අවස්ථාවක ශ්‍රී ලංකාව අලුත් යුගයක් අභිමුවෙහි සිටී. අන්ධකාර යුගයකට පසු අරුණාලෝකය උදා වෙමින් තිබේ. ත්‍රස්තවාදය වැනි අභ්‍යන්තරිකව පැවති විශාල ප්‍රශ්න අවසන් නමුත් ජාත්‍යන්තර අභියෝග එල්ල වෙමින් තිබේ. අලුත් යුගයට සමාන්තරව අලුත් අවුරුද්ද උදා වී ඇත. සිංහල හා දෙමළ අලුත් අවුරුද්ද ගැන සංස්කෘතික හා සාම්ප්‍රදායික වටිනාකම් ගැන අදහස් පළවී තිබේ. මේ හැම අදහසකින්ම අඟවන්නේ නැවුම් බලාපොරොත්තු පිළිබඳවය. අලුත් අපේක්ෂා ගැනය. ශ්‍රී ලාංකික සමාජය උත්සව පවත්වන්නට රුචියක් දක්වයි. සතුට බෙදා හදා ගන්නට කැමතිය. අවුරුදු උත්සව සමයේ රට පුරා සතුටු මුහුණු දැක ගත හැකිය. මේ සතුට සමග සමබරව සිතන්නට අවශ්‍යය. නැකැත් චාරිත්‍ර අනුව පරණ අවුරුද්ද ගෙවී අලුත් අවුරුද්දට සූදානම් වන ආකාරයට අලුත් ආකල්ප ඇතිව එළැඹෙන යුගයට මුහුණදීමට අදිටන් කර ගැනීම ඉතාමත් සුදුසුය.

ආර්ථික හා සමාජ ගෝලීයකරණය නිසා ජාත්‍යන්තරයේ සිදුවන බලපෑම් වලින් ඈත්වන්නට ශ්‍රී ලංකාව නොහැකිය. ජගත් ප්‍රජාව සමග ඇති සම්බන්ධතා මෙරටට බෙහෙවින් සමීපය. විදේශගත ඥාතියෙකුට ගුවනින් ලිපියක් යැවීම දශක දෙක තුනකට කලින් විශාල දෙයකි. එම ලිපියට පිළිතුරු ලැබෙන්නට සති දෙකක්වත් බලා සිටින්නට සිදුවෙයි. අද මෙහොතකින් ලෝකයේ ඕනෑම තැනක සිටින හිතවතෙකු සමග කතා කරන්නට පමණක් නොව ඔහුගේ සජීවී පින්තූර ද දැකිය හැකිය. ලාංකිකයන් මිලියනයක් පමණ ලෝකය පුරා විසිරී සිටී. ඔවුන් මෙරටට එවන මුදල රටට විනිමය උපයන විශාලම මාර්ගයයි. ලිබියාවේ සිදුවන දේ සේ ම, ජපානයේ සිදුවූ විපතත් රටට වෙනදාට වඩා දැනෙන්නේ මේ තාක්ෂණික දියුණුව නිසාය. සමීපවීම හෙයින්ය. ලෝකයේ සිදුවන අභියෝග වලින් රටට සිදුවන බලපෑම් වලට මුහුණ දීම සඳහා ලාංකිකයන් පෙළගැසෙන සාමූහික ව්‍යායාමයක් අද උවමනා වී තිබේ. එවැනි අලුත් දැක්මක්, අලුත් ආකල්ප ඇති කරගැනීමට බක් නොඑසේනම් භාග්‍යවන්ත මාසයේ, අලුත් අවුරුදු සමය කේන්ද්‍රීය ලක්ෂයක් කර ගැනීම අපට වටී.

මෑතක දී ලෝකය පුරා ආහාර අර්බුදයක් ඇති විය. එයට කලින් ආර්ථික අර්බුදයකට මුහුණ දී එයින් මිදෙමින් සිටි ජගත් ප්‍රජාව ආහාර හිඟයට මුහුණ දුන්නේ අනපේක්ෂිතවය. ආහාර හිඟය සමග ආහාර මිළ ගණන් බරපතල අන්දමින් මිළ වැඩි විය. කාලගුණය අයහපත් වී නිෂ්පාදන ඇනහිටීම හා ඉන්දියාව, චීනය හා අප්‍රිකානු රටවල් දියුණුවීම නිසා පරිභෝජනය වැඩිවීම ද නිෂ්පාදන ප්‍රමාණවත් නොවීමට

හේතු බව සඳහන් විය. වසර 2015 වන විට දිළිඳු බව අඩු වෙතැයි බලා සිටි ලෝක නායකයන්ට ආහාර මිළදී ගැනීමට ශක්තියක් නැතිව අසරණ හා දිළිඳු භාවයට පත්වන ලෝවැසියන් ගැන සොයන්නට අවධානය යොමු කරන්නට සිදුව තිබේ. බලවත් රටවල් මෙන්ම ජගත් සංවිධාන ද ලෝක ජනගහනය මුහුණ දෙන මෙම බරපතල ප්‍රශ්නය දෙස දැනටමත් බැරෑරුම් අන්දමින් අවධානය යොමු කර ඇත. එයට විසඳුම් වශයෙන් වැඩිපුර නිපදවන්නට යෝජනා කරයි. ලෝකය පුරා ජාන තාක්ෂණයෙන් ආහාර නිෂ්පාදනය වැඩි කරන සොයා ගැනීම් කෙරෙහි වෙහෙසෙයි. ජනගහනය වැඩිවන විට, භූමිය වැඩි වන්නේ නැත. සීමිත ඉඩකඩක වැඩි අස්වැන්න ගෙන දෙන ආහාර වගා කළ යුතුව තිබේ. අලුතින් ඉදිකරන ගොඩනැගිලි වල පවා පස් රහිතව දියර තාක්ෂණයෙන් ආහාර භෝග වගා කරන්නට ඉඩ වෙන්කරයි. මුහුද අසීමිතව ප්‍රයෝජනයට ගන්නට සූදානම් වෙයි. මසුන් පමණක් නොව මුහුදු පැලෑටි පවා වගා කරන්නට ඇතැම් රටවල් උනන්දු වී ඇත.

එවැනි පසුබිමක් තුළ අලුතින්ම මුණ ගැසෙන්නේ බලශක්ති අර්බුදයයි. සීතල යුද්ධය අවසන් වීම සමග ඇමරිකාන ලෝක බලවතා වී තිබේ. ප්‍රජාතන්ත්‍රවාදයට හා විවෘත ආර්ථිකයට ඉහළ පිළිගැනීමක් ලැබී ඇත. තොරතුරු තාක්ෂණය සමග තම රටවල නිදහස සංසන්දනය කරන තරුණ පරපුර පවතින පාලන ක්‍රම වලට එරෙහිව උද්ඝෝෂණය කරති. ටියුනීසියාව, ඊජිප්තුව, ලිබියාව, සුඩානය ඇතුළු මැද පෙරදිග හරහා ඇවිලෙමින් තිබෙන්නේ මේ දේශපාලන ගැටලුය. මැදපෙරදිග සමාජය මතු කරන දේශපාලන ගැටුම් ලෝක බලවතුන් ගේ යුධ බිමක් බිහිකර ඇත. බොර තෙල් නිපදවන රටවල් මේ අර්බුදයට මැදි වී ඇති අතර එහි ප්‍රතිඵලය වී ඇත්තේ ජාත්‍යන්තර ආර්ථිකයට අහිතකර අන්දමට තෙල් මිළ ඉහළ යාමයි. බොරතෙල් මිළ ගණන් ජගත් ප්‍රජාවට දැරිය නොහැකි ලෙස වැඩි වෙමින් තිබේ. ශ්‍රී ලංකාවේ වාර්ෂික ආනයන වියදමෙන් සියයට විස්සක් වැය වන්නේ ඉන්ධන ආනයනය වෙනුවෙන්ය. සම්පූර්ණ බොරතෙල් ආනයන වියදම ඇමරිකානු ඩොලර් බිලියන තුන ඉක්මවයි. තොරතුරු වලට අනුව රජයට තෙල් මිළ වැඩිවීමේ වියදම දරා ගැනීම පහසු නැත. එයින් කොටසක් මිළ වැඩි කිරීම සමග මහජනතාවගෙන් අය කරන්නට පසුගියදා තීරණය කළේය. ඉන්ධන මිල වැඩිවන විට, ප්‍රවාහන වියදම් ඉහල යන විට හා නිශ්පාදන වියදම වැඩි වන විට මහජනතාවට ගැටලු මතු වෙයි. සියලුම දේ මිළ ඉහල යයි. මහජනතාව අත්‍යාවශ්‍ය දේ සඳහා පවා මුදල් වැය කරන්නට නොහැකි ස්වභාවයට පත්වෙයි. මේ නිසා මිළදී ගැනීමේ හැකියාව අඩුවන අතර ෙ ආර්ථිකය විශම තත්ත්වයකට පත්වෙයි. මහජනතාව අද විමතියෙන් බලා සිටින්නේ ආහාර හා ඛනිජතෙල් ක්ෂේත්‍ර ආශ්‍රිතව ඇතිවෙමින් පවතින මෙම වෙනස්කම් අවසානයේ එල්ල කරන බලපෑම පිළිබඳවය.

ශ්‍රී ලංකාවේ පමණක් නොව දියුණු වෙමින් පවතින බොහෝ රටවල දේශපාලනය මේ අර්බුද ආණ්ඩු අප්‍රසාදයට පත් කරන්නටත් රටේ නොසන්සුන් වාතාවරණයක් ඇති කරන්නටත් සමත් වී තිබේ. ප්‍රජාතන්ත්‍රවාදීව බලයට පත්වන රජයක් මූලික මහජන අවශ්‍යතා ඉටුකරන ආකාරය ගැන මහජනතාව සෑහීමකට පත් නොවෙන අවස්ථාව තත්ත්වය ව්‍යාකූල කරයි. එනමුත් පවතින ජාත්‍යන්තර පීඩනයෙන් සහමුලින්ම ඈත්වන්නට හැකියාවක් නැත. එයට මුහුණ දිය යුතුය.

මෙම පරිසරය ලංකාවට පමණක් සීමා වූ එකක් නොවේ. ගෝලීයකරණය අනුව යමින් සීමා මායිම් නැති ලෝකය ජගත් ප්‍රජාව ගේ අවුල් වියවුල් මෙරයට දොරකඩට ගෙනැවිත් ඇත. මෙයින් මිදීම අපහසුය. ජගත් න්‍යාය පත්‍රයේ කොටසක් බවට ලංකාව අද පත්ව තිබේ. කැමැත්තෙන් හෝ අකමැත්තෙන් මේ ඉරණමට මුහුණ දිය යුතුය. ප්‍රශ්නයකට ඇත්තේ එකම උත්තරය නොවේ. එක පාර්ශවයක් සාධාරණ ලෙස සිතන උත්තරය තවත් පාර්ශවයකට අසාධාරණ එකකි. ප්‍රජාතන්ත්‍රවාදී සමාජය තුළ විවිධ මත

ඇත. පවතින ක්‍රම අනුගමනය නොකළේ නම් මෙවන් අභාග්‍යයකට මුහුණ දෙන්නට සිදු නොවෙතැයි තර්ක ඉදිරිපත් විය හැකිය. විවෘත ආර්ථිකය නිසා මේ අපහසුතා ඇතිවූ බව ට මතයක් ඉදිරිපත් වන අවස්ථා ඇත. නමුත් අතීතයට දොස් තබමින් හෝ විවේචනය කරමින් සිටිනවාට වඩා යථාර්ථය පිළිගැනීම වඩා උචිතය.

අපට ඉතිහාසයක් තිබිණ. කෘෂිකර්මය, තාක්ෂණය ගැන රටට අත්දැකීම් තිබිණ. බටහිරට යටත් වූ යුගයේ දී ලාංකික අනන්‍යතාවය විනාශ වී ගියේය. කෘෂිකර්මය පසුබෑමකට ලක්විය. අතීත අත්දැකීම් අනුව යමින් ලෝකයේ පවතින ස්වභාවයට හැඩ ගැසෙන්නට අවශ්‍ය පරිසරය අලුතින් සකසා ගැනීම අපහසු නැත. ගෝලියකරණයේ හෝ විවෘත ආර්ථිකයේ හරය යනු තරඟකාරීත්වයයි. තරඟකාරීත්වය ජීවිතයට සමීපය. ජීවය පවතින්නේ තරඟයට මුහුණ දීමට ඇති හැකියාව අනුවය. එය ස්වභාවික වරනයයි. ඒ අනුව අප අද අලුතින් සිතන්නට පටන් ගත යුතුය. ප්‍රශ්නය අවබෝධකරගෙන එයට ගැලපෙන ආකාරයට සමාජය පොදු අරමුණකට සංවිධානය කර ගත යුතුය. දැනටමත් දිවි නැගුම වැනි කෘෂිකර්මය ගෙවතු මට්ටමින් ඇති කරන ව්‍යාපෘති රජයේ මැදිහත්වීමෙන් ආරම්භ කර තිබේ. බලශක්තිය පරෙස්සමෙන් පාවිච්චි කිරීම හා විකල්ප බලශක්ති ප්‍රභව කරා යාම තවත් අවධානය යොමු කළ හැකි පැතිය. පලදායකත්වය, කාර්යක්ෂමතාවය ගැන මෙහිදී වැඩිපුර උනන්දු වීම අවශ්‍යය.

ආහාර අර්බුදය හා බලශක්ති ප්‍රශ්න සාධාරණ අන්දමින් නිරාකරණය කර ගැනීම සඳහා ඉක්මන් ක්‍රමවේද නැත. එමෙන්ම මේ විසඳුම් සොයා ගැනීම සඳහා මහජනතාවගේ  කැපවීමක්ද අවශ්‍යය. ගැටලුවක දී හුරුවී ඇත්තේ මීලඟ ඡන්දයට පෙර හෝ ඉතාමත් ඉක්මනින් විසඳුම් ඇතිවිය හැකිය යන්න ගැන අපේක්ෂාවන්ය. එවැනි විසඳුම් ප්‍රායෝගික නැත. ගැටලුවේ ස්වභාවය දෙස අවධාරණය යොමු කර මෙවැනි අවස්ථාවන් වලක්වන දීර්ඝ කාලීන ප්‍රතිපත්ති ඇතිකර ගත යුතුය. මෙම විසඳුම ලැබෙන තෙක් සමාජයේ ඉවසීම වැදගත්ය. කැපවීම අපේක්ෂා කළ යුත්තේ ගැටලුවෙන් පීඩා විඳින පාර්ශවයෙන් පමණක් නොවේ විසඳුම් නිර්මාණය කරන පාර්ශවයද ඒ හා සමාන උනන්දුවකින් හා කැපවීමකින් තමුන්ගේ කාර්ය භාරය ඉටු කරන වගට විශ්වාසයක් සමාජයේ තහවුරු කිරීම වැදගත්ය.

වර්තමානයේ දකින්නට නොලැබෙන්නේ එයයි. මහජනතාව පීඩා විඳියි. විසඳුමක් මහජනතාව විසින්ම නිරායාසයෙන් සොයා ගන්නා තෙක් අවධානයට ගැනෙන බවක් නොපෙනේ. මේ නිසා ඇති වන්නේ අප්‍රසාදයයි. එය ප්‍රජාතන්ත්‍රවාදී සමාජයකට නොගැලපෙන්නකි.

සිංහල හා දෙමළ අලුත් අවුරුද්ද සමග අලුතින් සිතන්නට අවස්ථාව ලැබී ඇත. අප මුහුණ දෙන ප්‍රශ්න රට අභ්‍යන්තර ඒවා පමණක් නොවේ. බාහිරව ඇතිවන විපත්, අර්බුද චක්‍රව ශ්‍රී ලංකාවේ ජන සමාජයටත් ආර්ථිකයටත් බලපෑම් කරයි. එහි පීඩනය විවිධ විය හැකිය. රටට අවශ්‍ය ආකාරයට විසඳා ගැනීමට ද අවස්ථාවක් තිබේ. එහෙත් සහ මුලින්ම එයින් අත්මිදී ජීවත්වන්නට අද ලෝක ස්වභාවයෙන් ඉඩ නැත. රටට අවශ්‍යව ඇත්තේ පොදු අරමුණකින් එළැඹ ඇති තත්ත්වයෙන් මිදී සැනසිලාදායක සමාජයක් කරා ගමන් කිරීමයි. අනාගත පරපුරට යහපත් හෙටක් උදාවන බවට විශ්වාසයක් ජනිත කිරීමයි.

**මිලින්ද මොරගොඩ**